අත්වැල්තොට පැලැන් ගඟ

මත්ස්‍ය ප්‍රජාව සඳහා

සංරක්ෂිත ගඟක් කරමු.

ගරු ජනාධිපතිතුමාගෙන් හා ගරු අගමැතිතුමාගෙන්
කෙරෙන ඉල්ලීමයි.

අත්වැල්තොට පැලැන්ත ගඟ
මත්ස්‍ය ප්‍රජාව සඳහා
සංරක්ෂිත ගඟක් කරමු.

ගරු ජනාධිපතිතුමාගෙන්
හා
ගරු අගමැතිතුමාගෙන්
කෙරෙන ඉල්ලීමයි.

අත්වැල්තොට පැලැන් ගඟ මත්ස්‍ය ප්‍රජාව සඳහා සංරක්ෂිත ගඟක් කරමු.

ගරු ජනාධිපතිතුමනි,

ලංකාව ජෛව විවිධත්වයෙන් උණුසුම් (hot spot) රටවල් 34 අතරේ සිටින බවට අපි උදම් ඇනුව ද ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳව නැවත සිතන්නට දැන් කාලය එළඹ ඇත. ලංකාව සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩපිළිවෙලක් තිබෙනවා ද? අපට එයට පිළිතුරක් තිබෙනවා ද? එසේ නම් අප සිටින්නේ කොතැන ද? අකමැත්තෙන් වුව ද පැවසීමට ඇත්තේ ලංකාවේ ජෛව විවිවධත්ව සංරක්ෂණය නමට පමණක් සීමා වී ඇති බවයි.

ජෛව විවිධත්ව සංරක්ෂණය යනු, සංරක්ෂිත කලාප වලට පමණක් සීමා වූ දෙයක් නොව මුළු මහත් රටක් ලෙස සිතිය යුතු කරුණකි. ඒ මන්දයත් සංරක්ෂිත කලාප වලින් පිටත ජෛව විවිධත්වයෙන් අනූන සංරක්ෂණය කළ යුතු බොහෝ සම්පත් ඇතත් එම ස්ථාන අද වනවිට විවිධ හේතූන් මත විනාශ වෙමින් පවතින නිසාය. විශේෂයෙන්ම වත්මන් සංවර්ධන ක්‍රමවේදය ජෛව විවිධත්ව හායනයට මූලික හේතුව ලෙස දැක්විය හැකිය. පසුගිය දශකය තුළ ලංකාව ගමන් කරන සංවර්ධන මාර්ගය ලංකාවට දරාගත නොහැකි සංවර්ධනයකි. එම සංවර්ධනය තුළ යාල, විල්පත්තුව වැනි ජාතික වනෝද්‍යාන විනාශ වීමට පටන් ගෙන ඇත. ඒවා සංරක්ෂණය කිරීමට නීති තිබුණ ද එම නීති ක්‍රියාත්මත නොවීම කණගාටුවට කරුණකි.

ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳව සංඛ්‍යාත්මක අගයක් දැක්වීමේ දී අපට ආඩම්බර විය හැකි නමුත් සංරක්ෂණය පිළිබඳව සැලකීමේ දී ඇතිවන්නේ කණගාටුවකි. විශේෂයෙන්ම දේශීය සපුෂ්ක ශාක 3154, උභය ජීවීන් විශේෂ 111, හෙමික උරගයින් විශේෂ 211, කුරුළු විශේෂ 465, ක්ෂීරපායී විශේෂ 125, මිරිදිය කකුළුවන් විශේෂ 51, සමනලයින් විශේෂ 245, මකුළු විශේෂ 501, බත් කුරන් විශේෂ 118, ලෙස අපට ලංකාවේ වාර්තාවන ජෛව විශේෂ සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළ හැක. ජෛව විවිධත්වයෙන් මූලික කොටසක් වන මිරිදිය මසුන් පිළිබඳව සැලකීමේ දී එම ජීවී කාණ්ඩය ආරක්ෂා කිරීම සඳහා ලංකාව තුළ ක්‍රමවේදයක් තිබේ ද? මෙය සැළකිල්ලට භාජනය කළ යුතු කරුණකි. අද වන විට ලංකාවේ මිරිදිය මත්ස්‍යයින් ගණන 90කි. ඒ අතරින් විශේෂ 53ක්ම ලංකාවට පමණක්ම

ආවේණික මත්ස්‍යයින් වේ. ලංකාවේ සංරක්ෂිත වනාන්තර තුළ ඇති ඇළ දොළ ගංගාවල ජීවත් වන මිරිදිය මසුන් යම් පමණකට සංරක්ෂණය වී තිබුණ ද ඉන් පිටත ඇති ඇළ දොළ ගංගා වල ජීවත් වන දේශීය හා ඒක දේශීය මත්ස්‍ය විශේෂ සීඝ්‍ර ලෙස වඳ වී යාමේ තර්ජනයට පත්ව ඇත. විශේෂයෙන්ම වත්මන් සංවර්ධන ක්‍රමවේදය තුළ හා මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙම මත්ස්‍යයින්ට අභාග්‍ය සම්පන්න කාලයක් උදා වී ඇත.

මින් මුල් තැන ගන්නේ ඇළ දොළ ගංගා ආශ්‍රිතව ඉදි කරන කුඩා හා මහා පරිමාණ වේලි නිසාය. විශේෂයෙන්ම කැළණි, කළු, ගිං, නිල්වලා යන ගංගා වල අතු ගංගා ආශ්‍රිතව ඉදි වන වේලි නිසා මෙම මිරිදිය මසුන්ගේ වාසස්ථාන තර්ජනයට ලක්ව ඇත. පහතරට තෙත් කලාපීය වැසි වනාන්තර තුළින් බිහිව පහළට ඇදෙන පිරිසිදු ඇළ දොළ හරස් කර ඉදි කරන කුඩා පරිමාණ විදුලි බලාගාර නිසා මෙම කලාපයට ආවේණික මත්ස්‍ය විශේෂ වඳ වී යාමේ තර්ජනයට පත්ව ඇත. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ කුකුලු ගඟ, මගුරු ගඟ හා පැලන්ගඟ මෙන්ම ඒ ආශ්‍රිතව ඇළ දොළ තුළින් ඇද හැලෙන දිය ඇළි හරස් කර කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදි කිරීම සඳහා පෞද්ගලික සමාගම් මහත් උනන්දුවක් දක්වයි. එසේ කරනුයේ රටේ විදුලි අවශ්‍යතාව සඳහා පුනර්ජනීය විදුලිය ලබා දීමේ පරිසර හිතකාමී සිතකින් නම් නොවේ. ඒ ඔවුන්ගේ උපරිම ලාභය පරමාර්ථ කොට ගනිමිනි. දැරණියගල ඇලි හත ආශ්‍රිතව, සිංහරාජ කොස්ගුලන ගඟ, කුරුවිට මරු කන්ද, හඳගිරි ඇල්ල, කල්තොට ඉලුක් පෑලැස්ස, නෙළුව ආඳාදොල, බදුරලිය දික්හේන මගුරු ගඟ, මෝල්කාව කුකුලේ ගඟ පිළිබඳව විරෝධතා පැනනැගී ඇත්තේ එබැවිනි. ඒ හා සම්බන්ධ තවත් උදාහරණයක් වන්නේ මොරපිටිය, අත්වැල්තොට, පැලන්ගඟ, පීලිතුඩ ඇල්ල හරස් කර ඉදි කිරීමට යෝජිත මෙගා වොට් 1.5 ක ජල විදුලි බලාගාරයයි.

කළුතර දිස්ත්‍රික්කයේ, බදුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අත්වැල්තොට ප්‍රදේශයේ පිහිටි පැලැන් ගඟ සිංහරාජ අඩවියෙන් ආරම්භ වී කුකුලේ ගඟේ අතු ගංගාවක් ලෙස පහළට බැස යන නොයිදුල් ගඟකි. අත්වැල්තොට මොරපිටිය ගම්මාන අතර පීලිතුඩ ඇල්ල ලෙස මීටර් 5 ක් පමණ උස දිය ඇල්ලක් සොබාව සෞන්දර්යයට දායාද කරමින් චිරාත් කාලයක් මුළුල්ලේ ප්‍රදේශවාසීන්ගේ මෙන්ම දෙනෝදාහක් සංචාරකයන්ගේ ජල පවස නිවමින් නිසොල්මනේ ගලා බැස යන්නේය. ඒක දේශික මත්ස්‍ය විශේෂ 15 ක් මෙන්ම ආවේණික මත්ස්‍ය විශේෂ 18 ක් ද මෙම දිය ඇල්ල ආශ්‍රිතව තමන්ගේ වාසස්ථාන කරගෙන ඇත. මෙම පීලිතුඩ ඇල්ල සහ එහි ඉතා දුර්ලභ ජෛව ප්‍රජාව විනාශ කරමින් රුපියල් මිලියන 350 ක වියදමින්

මෙගා වොට් 1.5 ක කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට වරායේ අධිකාරියේ සභාපති දම්මික රණතුංග මහතාට අයත් සකුරා එනර්ජි පුද්ගලික සමාගම යෝජිතව ඇත. මේ ව්‍යාපෘතිය යටතේ පැලැන් ගඟේ පීලිතුඩ ඇල්ල හෙවත් අත්වැල්තොට ඇල්ලට ඉහළින් වේල්ලක් ඉදි කර ජලාශයක් තනා එම ජලය ගඟේ පහළට මීටර් 800 ක් පමණ රැගෙන ගොස් එහි ඉදිකරන බලාගාරයක් මඟින් විදුලිය නිපදවීමට සැලැසුම් කර ඇත.

සම්පූර්ණයෙන්ම ගඟ හරස්කර ඉදිවන මෙම ජල විදුලි බලාගාරය නිසා මත්ස්‍යයින්ගේ වාස භූමිය සම්පූර්ණයෙන්ම හානියට ලක් වේ. මෙගා වොට් 1.5 ක ජල විදුලි බලාගාරයක් සඳහා මෙවන් ආවේණික මත්ස්‍ය වර්ග 18 කගේ වාස භූමිය අහිමි කරවීම පෙව විවිධත්ව සංරක්ෂණයද?

එසේනම් කළ යුත්තේ මෙම මත්ස්‍යයින්ගේ වාස භූමිය සංරක්ෂණය කර දීමයි. ඒ සඳහා අදාළ ආයතන ක්‍රියා කළ යුතුය. මහා පරිමාණ ජල විදුලි බලාගාර මෙන්ම විශාල ගල් අඟුරු බලාගාර ඉදිවන ලංකාවේ, හිරු එළිය විදුලිය නිපදවීම සඳහා ඇති හොඳම මාධ්‍ය ලෙස කටයුතු කරන අවධියක පෙව විවධත්වයෙන් අනූන් ඇළ දොළ හා දියඇළි විනාශ කරමින් කරන කුඩා ජල විදුලි ව්‍යාපෘති සඳහා තිත තැබිය යුතු කාලය එළඹ ඇත. වනාන්තර, කොරල්පර හා වන ජීවීන් සංරක්ෂණය සඳහා ආරක්ෂිත වන භූමි තිබුණ ද මත්ස්‍ය ප්‍රජාව සංරක්ෂණය සඳහා මේ වනතෙක් සංරක්ෂණ භූමි වෙන් කර නොමැත. අධික පෙව විවිධත්වයෙන් යුත් ගංගා, වන ජීවී සහ පරිසර පනත් යටතේ සංරක්ෂිත ප්‍රදේශ බවට පත් කිරීමට කාලය එළඹ ඇත. **එහි ආරම්භයක් ලෙස අත්වැල්තොට පීලිතුඩ ඇල්ල පිහිටා ඇති පැලැන් ගඟ සංරක්ෂිත කලාපයක් ලෙස නම් කිරීමට යෝජනා කරමු.**



පීලිතුඩ ඇල්ලට ඉහළින් පැලැන් ගඟ හරහා ඉදි කිරීමට නියමිත වේල්ල හේතුවෙන් ගඟේ ඉහළ කොටස් වලට වැසි කාලයේ දී උග්‍ර ගංවතුර තර්ජන ඇති වන අතර වේල්ලට පහළින් ගඟේ මීටර් 800 ක් පමණ කොටසකට ජලය අහිමි වී යයි. මේ නිසා පැලැන් ගඟේ ජලජ ශාක හා මිරිදිය මත්ස්‍ය විශේෂ, මිරිදිය කකුළුවන් විශේෂ, මිරිදිය ගොළුබෙල්ලන් මෙන්ම උභයජීවීන්ගේ පැවැත්මට ද තර්ජන එල්ලවී බොහෝ විශේෂ මේ ප්‍රදේශයෙන් සම්පූර්ණයෙන්ම වඳවී යාමේ හැකියාව පවතී. ඊට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නේ පැලැන් ගඟේ ජලජ ජීවීන්ගේ වාසස්ථාන මෙම ව්‍යාපෘතියත් සමඟම වෙනස්කම් වලට ලක් වීමය.

මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීමට සකස් කළ මූලික පාරිසරික විශ්ලේෂණ වාර්තාව ඉතාම දුර්වල මට්ටමේ වාර්තාවක් වන අතර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ වලට යටත්ව ව්‍යාපෘතිය අනුමත කිරීමේ ආයතනය වන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීම කණගාටුවට කරුණකි. එම වාර්තාවේ පැලැන් ගඟේ ජීවත් වන මිරිදිය කකුළුවන් හෝ මිරිදිය ඉස්සන් හෝ මිරිදිය ගොළුබෙල්ලන් හෝ මිරිදිය ශාක විශේෂ පිළිබඳව අධ්‍යයනයට ලක් කර නොමැත.

ලංකාවේ මිරිදිය කකුළුවන් විශේෂ 51 ක් වාර්තා වන අතර ඉන් විශේෂ 50 ක් අප රටට ආවේණික වේ. මිරිදිය ඉස්සන් විශේෂ 23 ක් හා මිරිදිය ගොළුබෙල්ලන් විශේෂ 94 ක් ලංකාවේ වාර්තා වේ. එපමණක් නොව ජලජ ශාක අතුරින් අතිඋඩයන් *(Cryptocoryne)* විශේෂ 11 ක් වන අතර එම විශේෂ සියල්ලම ලංකාවට ආවේණික වේ. එපමණක් නොව මේ විශේෂ සියල්ලම වඳවීමේ තර්ජනයට මුහුණපා ඇති අතර විශේෂ 5 ක් දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක් ව තිබේ. කෙටල *(Leginandra)* විශේෂ 8 ක් ඇති අතර ඉන් විශේෂ 7 ක් ලංකාවට ආවේණික වේ. ඉන් විශේෂ 6 ක් වඳවීමේ තර්ජනයට මුහුණපා තිබේ. කෙකටිය *(Aponogetone)* විශේෂ 4 ක් ඇති අතර ඉන් විශේෂ 2 ක් ලංකාවට ආවේණික වේ. මේ විශේෂ සියල්ලම වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති අතර එක් විශේෂයක් වඳවීමේ තර්ජනයට දැඩි ලෙස පාත්‍රවී සිටී. මෙවන් තත්ත්වයක් පවතිද් දී අත්වැල්තොට කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට අදාළ වාර්තාවේ මේ පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමක් සිදු කර නොමැති වීම විශාල අඩුපාඩුවකි. අසම්පූර්ණ වාර්තාවක් පදනම් කර ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පෙව විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් දැවැන්ත අහිතකර බලපෑම් එල්ල වනු ඇත.

ව්‍යාපෘතියට අදාළ වාර්තාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ පිළිබඳව පමණක් සඳහන් වේ. එම දත්තයන් ද අසම්පූර්ණ ය. මේ නිසා 2001 වසරේ සිට මේ දක්වා වරින්වර අත්වැල්තොට, පැලැන් ගඟේ මත්ස්‍ය විවිධත්වය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයන වලට අනුව මෙහි විශාල මත්ස්‍ය විවිධත්වයක් වාර්තා වන බව තහවුරු වී ඇත.

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ 90 ක් වාර්තා වන අතර ඒ අතුරින් විශේෂ 53 ක් ලංකාවට ආවේණික වේ. එම විශේෂ ගෝත්‍ර 10 ක්, කුල 22 ක් හා ගන 46 ක් යටතේ වර්ග කර තිබේ. ඒ අතුරින් ගෝත්‍ර 5 කට, කුල 12 කට හා ගන 25 කට අයත් මිරිදිය මත්ස්‍ය විශේෂ 32 ක් පමණ අත්වැල්තොට පැලැන් ගඟේ ජීවත් වේ. ඒ අතර ආවේණික විශේෂ 18 ක් වෙයි.

මේ අනුව ලංකාවේ වාර්තා වන සමස්ථ මිරිදිය මත්ස්‍ය විශේෂ අතුරින් 36% ක් හා ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂ අතුරින් 34% ක් පැලැන් ගඟේ අත්වැල්තොට ප්‍රදේශයෙන් පමණක් වාර්තා වීම විශේෂත්වයකි.

වඳවීමේ තර්ජනයට මුහුණ දී ඇති ජීවී විශේෂ වල තොරතුරු ඇතුළත් 2012 ජාතික රතු දත්ත ලේඛණයට අනුව මෙරට මිරිදිය මත්ස්‍ය විශේෂ අතුරින් 50 ක් වඳවීමේ තර්ජනයට ලක්ව තිබේ. ඒ අතුරින් විශේෂ 42 ක් ලංකාවට ආවේණික විශේෂ වේ. එම විශේෂ තව දුරටත් විස්තර කරන්නේ නම් දැඩි තර්ජිත (Critically Endangered) විශේෂ 21 ක්, තර්ජිත (Endangered) විශේෂ 19 ක්, අවධානම් (Vulnerable) මට්ටමේ සිටින විශේෂ 5 ක් හා ආසන්න තර්ජිත (Near Threatened) මට්ටමේ සිටින විශේෂ 5 ක් වෙයි.

මේ අතුරින් අත්වැල්තොට, පැලැන් ගඟේ වඳවීමේ තර්ජනයට ලක් වී ඇති මත්ස්‍ය විශේෂ 18 ක් වාර්තා වන අතර ඉන් විශේෂ 16 ක් ආවේණික වේ. ඒ අතර දැඩි තර්ජිත විශේෂ 2 ක්, තර්ජිත මට්ටමේ විශේෂ 10 ක්, අවධානම් තත්ත්වයේ සිටින විශේෂ 2 ක් හා ආසන්න තර්ජිත මට්ටමේ සිටින විශේෂ 4 ක් වේ. මෙම ප්‍රදේශයේ මෙරට වඳවීමේ තර්ජනයට ලක් වූ මිරිදිය මත්ස්‍ය විශේෂ අතුරින් 36%ක් රැකවරණය ලබමින් ජීවත් වීම සුවිශේෂත්වයකි. මීට අමතරව ලංකාවේ වඳවීමේ තර්ජනයට ලක් වූ ආවේණික මත්ස්‍ය විශේෂ අතුරින් 38% ක් රැකවරණය ලබයි. දැඩි

ලෙස වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති, 1998 වසරේ දී විද්‍යා ලොවට හඳුන්වාදුන් මෙරටට ආවේණික මාර්ටින්ස්ටයින් වැලිගොව්වාගේ *(Stiphodon martenstyni)* පළමු නිදර්ශකය හමු වී ඇත්තේ ද අත්වැල්තොටිනි. 1957 වසරේ දී නාමකරණය කරන ලද දැඩි ලෙස වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති කළු වරල් හල් මල් දන්ඩියා *(Rasboroides nigromaginatus)* ජීවත් වන බවට වාර්තා ඇත්තේ අත්වැල්තොටින් පමණි. මෙම මත්ස්‍ය විශේෂ දෙක මුළු ලෝකයේ ම හමුවන එකම ස්ථානය අත්වැල්තොට වීම අපට ආඩම්බරයක් නොවේ ද. මේ සියල්ල පැලැන් ගඟේ අම්ල වූ වටිනාකම කියාපාන සාධකයන්ය.

ලංකාවේ ආරක්ෂිත මත්ස්‍ය විශේෂ බොහොමයකට ද පැලැන් ගඟේ රැකවරණය ලැබී තිබේ. 2009 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1937 අංක 2 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 31අ වගන්තියට අනුව මිරිදිය මත්ස්‍ය විශේෂ 12 ක් ආරක්ෂිත විශේෂ ලෙස නම් කර ඇත. එම විශේෂ වලට හානි සිදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි. මෙම ආරක්ෂිත මත්ස්‍යයන්ට මොනයම් ආකාරයක හෝ හානි සිදු කරන පුද්ගලයකු මහේස්ත්‍රාත් අධිකරණයක දී වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් 10,000 ත් 20,000 ත් අතර දඩයකට හෝ අවුරුදු 2 ත් 5 ත් අතර සිර දඩුවමකට හෝ මේ දෙකටම යටත් කළ හැකිය. මෙවන් නීතිමය ආරක්ෂාවක් මෙම මත්ස්‍ය විශේෂ වලට ලබා දී ඇත්තේ එම සතුන්ගේ ආවේණිකත්වය හා දුර්ලභ භාවය සලකා බැලීමෙනි. ඒ අනුව අත්වැල්තොට, පැලැන් ගඟේ ආරක්ෂිත මත්ස්‍ය විශේෂ දෙකක් වන කොළ කනයා හා තොළ රතු වැලිගොව්වා ජීවත් වේ. එම සතුන්ගේ පැවැත්මට හානි සිදු කරමින් කුඩා ජල විදුලි බලාගාරයක් ඉදි කිරීමේ හැකියාවක් නොමැත.

සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 හා 61 වගන්ති වලට අදාළව ප්‍රකාශිත 1998 ජූලි 16 දින අංක 1036/13 දරන ගැසට් නිවේදනයට අනුව ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ අතුරින් 13 ක් අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති අතර තවත් විශේෂ 8 ක් අපනයනය සීමා කර ඇත. අපනයනය තහනම් කර ඇති මත්ස්‍ය විශේෂ අතුරින් කොළ කනයා හා තොළ රතු වැලිගොව්වා යන විශේෂ දෙක හා අපනයනය සීමා කර ඇති මත්ස්‍ය විශේෂ අතුරින් තල්කොස්සා, මඟුරා, දෙපුල්ලියා, බුලත් හපයා, ලේ තිත්තයා, හල්මල් දන්ඩියා යන විශේෂ හය පැලැන් ගඟේ, අත්වැල්තොට ප්‍රදේශයේ ජීවත් වේ. මෙම පනත යටතේ

අපනයනය තහනම් කර හා අපනයනය සීමා කර ඇත්තේ මෙම මත්ස්‍ය විශේෂ වල පැවැත්මට ඇති තර්ජන සැලකිල්ලට ගෙනය. එසේ තිබිය දී එම සතුන් ජීවත්වන වාසස්ථාන කුඩා ජල විදුලි බලාගාරයක් හරහා සම්පූර්ණයෙන්ම විනාශ කිරීමට කිසිදු හැකියාවක් නොමැත.

සෘජුව සිදු වන වාසස්ථාන විනාශයට අමතරව ගඟ හරහා වේලි ඉදි කිරීමෙන් සමහර මත්ස්‍ය විශේෂ වල බෝවීමේ ක්‍රියාවලියට ද බලපෑම් එල්ලවේ. ලංකාවට ආවේණික දුර්ලභ විශේෂයක් වන තොළ රතු වැලිගොව්වාගේ *(Sicyopus jonklaasi)* බෝවීම සිදු වන්නේ දිය පහරේ දමන බිත්තර ගඟේ පහළට ගසා ගෙන ගොස් කලපු ජලයේ දී පැටවුන් බිහි වේ. නැවත එම පැටවුන් දිය පහර දිගේ මව් සතුන්ගේ වාසස්ථාන වලට පැමිණේ. මේ ක්‍රියාවලිය ජල විදුලි බලාගාර සඳහා වේලි ඉදි කිරීමත් සමඟම සම්පූර්ණයෙන්ම ඇහිරී යයි.

ඉහත කරුණු හේතු කොටගෙන අප යෝජනා කරන්නේ

සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24 (ඇ) හා (ඈ) වගන්ති වලට අනුව හා ඊට අදාළ අනෙකුත් නීති ප්‍රතිපාදන ප්‍රකාරව අත්වැල්තොට, පැලැන් ගඟ පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර එම ප්‍රදේශය සංරක්ෂණය සඳහා උපායමාර්ග සකස් කළ යුතුව ඇති බවය.

ඒ සඳහා

- අත්වැල්තොට, පැළැන්ගඟ සංවේදී පරිසර පද්ධතියක් වශයෙන් පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස නම් කිරීම.
- අනෙකුත් අතිශය සංවේදී ගංගාවල සිදු කරන කුඩා ජල විදුලි බලාගාර ඇතුලු අනෙකුත් හානිකර ව්‍යපෘති වහාම නවතා දැමීම.
- පෙව විවිධත්වයෙන් අනූන අනෙකුත් ගංඟා හා ඇළදොල සංරක්ෂණය කිරීම සඳහා පියවර ගැනීම.
- සියළු ගංගාවල ස්වාභාව සෞන්දර්යට හානිවන ආකාරයේ ගඟ දෙපස ඉදිකරන ඉදිකිරීම් නවතා දැමීම හා ගඟ දෙපස රක්ෂිත ආරක්ෂා කරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන සකස් කිරීම.

මෙයට,

නම	ආයතනය
1. හේමන්ත විතානගේ	පරිසර යුක්ති කේන්ද්‍රය.
2. ජගත් ගුණවර්ධන	පරිසර නීතිඥ.
3. සමන්ත ගුණසේකර	විශ්‍රාමික, සහකාර රේගු අධ්‍යක්ෂක පෙව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් සුරැකීමේ අංශය
4. සජීව චාමිකර	පරිසර සංරක්ෂණ භාරය, පන්නිපිටිය.
5. නදීක හපුආරච්චි	වනජීවී සංරක්ෂණ සංගමය, ගාල්ල.
6. තිලක් කාරියවසම්	ශ්‍රී ලංකා සොබා සාමූහිකත්වය, මහරගම.
7. කාමිණී විතාරණ	රුක් රැකගන්නෝ, කොළඹ.
8. අයිරාංගනී සේරසිංහ	පරිසරවේදිනී.
9. චින්තක රාජපක්ෂ	ඉඩම් හා කෘෂි ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය, කොළඹ.
10. සඳුන් තුඩුගල	ඉඩම් අයිතිය සඳහා වූ ජාතික ව්‍යාපාරය
11. රවින්ද්‍රනාත් දාබරේ	පරිසර නීතිඥ.
12. මිහිරි ගුණවර්ධන	ජන සුභසාධන නීති පදනම, කොළඹ
13. චන්දන ජයකොඩි	පරිසරවේදී.
14. සරත් ඉද්දමල්ගොඩ	ශ්‍රම අභිමානී සංසදය, සීදුව.
15. ආචාර්ය තනුජා ආරියනන්ද	ලංකා වැසි ජල රැස්කරන්නන්ගේ සංගමය, කොළඹ.
16. රංග පල්ලවල	ජනතාක්ෂණ ආයතනය, කිරුළපන.
17. සංජීව බණ්ඩාර	සොබා පදම, මොණරාගල.
18. ජනක ඉඳුරුවගේ	සෙනෙහස පරිසර සංවිධානය, ලබුගම
19. අශෝක හරිස්චන්ද්‍ර	ශ්‍රී ලංකා පරිසර සම්මේලනය, කොළඹ
20. රංජිත් වික්‍රමසිංහ	පරිසරය හා ළමා අයිතිවාසිකම්. සුරකීමේ සංවිධානය, ඇහැළියගොඩ
21. මනෝජ් දිවිතුරාගම	තරුණ ප්‍රගතිශීලී පදනම, මාතර.
22. මධුර ද සිල්වා	වනජීවී සංරක්ෂණ සංගමය, ගාල්ල.
23. ආර්.ඩී.කේ.ජී. ජයතිස්ස	ග්‍රාම අභිවෘද්ධි පරිසර සංරක්ෂණ පදනම, මාතලේ.
24. ආර්.එම්. සම්පත් ආරියසේන	මිහිමව් විද්‍යා පදනම, පොල්ගස්ඕවිට
25. කරුණාදාස මූණගම	කොඩිගහකන්ද පෙව වවිධත්ව මධ්‍යස්ථානය, ගෝනපොල.
26. නිමල් හේවානිල	නිර්මාණී සංවර්ධන පදනම, කෑගල්ල
27. එච්.පී.සී.ඩී. ප්‍රසංග	නිවර්තන දේශගුණික විපර්යාස පර්යේෂණ හා අධ්‍යාපන මධ්‍යස්ථානය, නුවරඑළිය.
28. චන්ද්‍රා හේවාගාල්ලගේ	විකල්පනී ජාතික කාන්තා මධ්‍යස්ථානය, මාලඹේ.
29. රේණුකා භද්‍රකාන්ති	වැලිගෙපොළ කාන්තා පරිශ්‍රමය, බලංගොඩ.

නම	ආයතනය
30. ඒ.එම්.එස්. අත්තනායක	පෙව විවිධත්ව මධ්‍යස්ථානය, බදුල්ල
31. ජී.ඒ. ප්‍රභාත් කුමාර	අනාගතේ අපේ අතේ සංවිධානය, බදුල්ල
32. ඊ.එම්. චන්ද්‍රසේකර	පළතුරු වීළවළු නිපදවන්නන්ගේ සංගමය, බණ්ඩාරවෙල.
33. චම්ලී ජයරත්න	කිරි නිපදවන්නන්ගේ සංගමය, මාදම්පේ
34. චතුර වැලිවිටිය	මානව හා පරිසර සම්බන්ධතා සංවර්ධනය කිරීමේ සංවිධානය, ගාල්ල
35. සුනිල් පොද්දෙනිය	ප්‍රජා කේන්ද්‍රීය සම්පත් හුවමාරුව, මීගහතැන්න.
36. පී. සෝමසිරි	පානම්පත්තුව පරිසර සංවිධානය, පානම.
37. සමන් අල්විස්	සමඟි ශක්ති සංවිධානය, අගලවත්ත.
38. ජී.ඒ.ඩී. ප්‍රේමතිලක	මානව හා පරිසර සංවර්ධන සංවිධානය, දැරණියගල.
39. සුනිල් ශාන්ත	වීදිය බණ්ඩාර පරිසර සංරක්ෂණ සංගමය
40. වසන්තා රූපසිංහ	මානව සම්පත් කේන්ද්‍රය, අරනායක.
41. වී. බුලත්සිංහල	ජනවබෝද කේන්ද්‍රය, මීගමුව.
42. සුගත් චන්ද්‍රසේන	සබරගමු ජනතා පදනම, රත්නපුර.
43. එස්.පී. අන්තෝනිමුත්තු	සෞම්‍ය තරුණ පදනම, යටියන්තොට
44. සිසිර විජේසිංහ	තිරසර කෘෂි පුහුණු මධ්‍යස්ථානය, අගලවත්ත.
45. කරුණාවතී මැණිකේ	විල්පොත කාන්තා ඉතුරුම් පරිශ්‍රමය, හලාවත.
46. ඒ.ජී. ශ්‍රියාණි ඒකනායක	ග්‍රාමීය සංවර්ධන මහා සංගමය, නාවුල.
47. අමිත් සේනානායක	හන්තාන ආරක්ෂක සංගමය, මහනුවර.
48. දයා උඩුරාවණ	සොබා ඔසු සුව වේවා පදනම, මහනුවර.
49. රෝහණ ස්ටැන්ලි	අරුණෝදය පාරිසරිකයෝ, දිවුලපිටිය.
50. බදුල්ලගම සුමනසාර හිමි	වෙල්ලස්ස සංවර්ධන පදනම, බිබිල.
51. නෙල්ලිවෙල සුමේධාලංකාර හිමි	වේලිඔය සුරැකීමේ සංවිධානය, වේලිඔය.
52. උදය ලියනගේ	නිවර්තන අධ්‍යන හා සංරක්ෂණ ආයතනය, කොස්ගම.
53. අජන්ත පලිහවඩන	පරිසරවේදී
54. ආදිශිෂ්‍ය සංගමය	වීදිය බණ්ඩාර මහා විද්‍යාලය, මොරපිටිය
55. අජිත් ලොකුගේ	වන ගෙවතු පරිසර සංවිධානය, හපුතලේ.
56. ජනක විතානගේ	පාලින්ද නුවර පරිසර සංරක්ෂණ සංගමය.
57. පී.ආර්. විජේවර්ධන	මානව හා ප්‍රජා සංවර්ධන තරුණ සංවිධානය, නොච්චියාගම
58. ප්‍රවීන් අබේරත්න	පරිසර සංවිධාන සම්මේලනය
59. රොෂාන් චතුරංග	ඇලි හත සංරක්ෂණ වැඩසටහන, දැරණියගල.
60. නන්දන ශ්‍රී කෝට්ටගොඩ	කුකුලේගඟ පරිසර ජනමාධ්‍යවේදී සංගමය

ඇමුණුම

ශ්‍රී ලංකාවේ හා අත්වැල්තොට, පැලැන්ත ගඟේ වාර්තා වන මත්ස්‍ය විශේෂ වල වර්ගීකරණ මට්ටම් වල විවිධත්වය හා වාර්තා වන ප්‍රතිශතය

	ජාතික රතු දත්ත ලේඛණයට අනුව තර්ජිත මට්ටම			
	දැඩි තර්ජිත	තර්ජිත	අවදානම්	ආසන්න තර්ජිත
ශ්‍රී ලංකාව	21	19	5	5
අත්වැල්තොට	2	10	2	4
ප්‍රතිශතය	10%	52%	40%	80%

වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥු පනත යටතේ සහ ඩීවර හා ජලජ සම්පත් පනත යටතේ ආරක්ෂිත හා අපනයනය විධිමත් කර ඇති මත්ස්‍ය විශේෂ අතුරින් අත්වැල්තොට පැලැන්ත ගඟේ වාර්තා වන ප්‍රමාණය හා ප්‍රතිශතය

	වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥු පනත යටතේ ආරක්ෂිත විශේෂ	ඩීවර හා ජලජ සම්පත් පනත යටතේ	
		අපනයනය තහනම් විශේෂ	අපනයනය සීමා කර ඇති විශේෂ
ශ්‍රී ලංකාව	12	13	8
අත්වැල්තොට	2	2	6
ප්‍රතිශතය	17%	15%	75%

අත්වැල්තොට පැලැන් ගඟේ වාර්තා වන මත්ස්‍ය විශේෂ නාමාවලිය

කොටි යෙදුම්

E - ආවේණික

CR - දැඩි තර්ජිත

EN - තර්ජිත

NT - ආසන්න තර්ජිත

VU - අවදානම්

FFPO - වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට අනුව ආරක්ෂිත මත්ස්‍ය විශේෂ

FARA -1 - ධීවර හා ජලජ සම්පත් පනත යටතේ අපනයනය තහනම් කර ඇති මත්ස්‍ය විශේෂ

FARA -2 - ධීවර හා ජලජ සම්පත් පනත යටතේ අපනයනය සීමා කර ඇති මත්ස්‍ය විශේෂ

Order (ගෝත්‍රය) - Cypriniformes

Family (කුලය) **Cyprinidae**

1. Devario malabaricus – දන් කොළ සාලයා
2. Dawkinsia singhala – දන් කොළ පෙතියා - E
3. Garra ceylonensis – ගල් පාඩියා – E, VU
4. Pethiya cumingii – කහ වරල් දෙපුල්ලියා – E, EN, FARA-2
5. Pethiya nigrofasciata – බුලත් හපයා – E, EN, FARA-2
6. Puntius bimaculatus – ඉපිලිකඩයා
7. Puntius titteya – ලේ තිත්තයා – E, EN, FARA-2
8. Puntius vittatus – බණ්ඩි තිත්තයා
9. Rasbora dandiya – දන්ඩියා
10. Rasbora microcephalus – කාවෙරි දන්ඩියා
11. Rasboroides nigromaginatus – කළු වරල් හල් මල් දන්ඩියා – E, CR
12. Rasboroides pallidus – පඩුවන් හල් මල් දන්ඩියා – E, EN, FARA-2
13. Systomus pleurotaenia – හීත මස්සා – E, EN
14. Systomus spilurus – මස් පෙතියා – E
15. Tor khudree – ලෙහෙල්ලා – NT

Family (කුලය) - Balitoridae

16. Acanthocobitis urophthalmus – වයිරන් අහිරාවා – E, EN
17. Schistura notostigma – කදුකර අහිරාවා – E, NT

Family (කුලය) - Bagridae

18. Mystus ankutta – අංකුට්ටා – E, EN
19. Mystus vittatus – ඉරි අංකුට්ටා

Order (ගෝත්‍රය) - Siluriformes

Family (කුලය) - Siluridae

20. Ompok bimaculatus – වලපොත්තා

Family (කුලය) - Clariidae

21. Clarias brachysoma – මඟුරා – E, NT, FARA-2

Family (කුලය) - Heteropneustidae

22. Heteropneustes fossilis – හුංගා

Order (ගෝත්‍රය) - Cyprinodontiformes

Family (කුලය) - Belonidae

23. Xenentodon cancila – යොනා - NT

Family Family (කුලය) - Aplocheilidae

24. Aplocheilus dayi – උඩ හඳයා – E, EN

Order (ගෝත්‍රය) - Cyprinodontiformes

Family (කුලය) - Gobiidae

25. Awaous melanocephalus – බලි වැලිගොව්වා

26. Sicyopus jonklaasi – තොළ රතු වැලිගොව්වා – E, EN, FFPO, FARA-1

27. Stiphodon martenstyni – මාර්ටින්ස්ටයිනි ගේ වැලිගොව්වා – E - CR

Family (කුලය) - Belontidae

28. Belontia signata – ගල්කොස්සා – E, NT, FARA-2

29. Pseudospromenus cupanus – පුලුට්ටා

Order (ගෝත්‍රය) - Channiformes

Family (කුලය) - Channidae

30. Channa orientalis – කොළ කනයා – E, VU, FFPO, FARA-1
31. Channa kelaartii – පරඩැල් කනයා

Family (කුලය) - Mastacembelidae

32. Mastacembelus armatus – ගං තෙලියා

Pethia cumingii (Gunther,1868)
E - Cuming 's Barb
S - Kahawaral Depulliya/Potaya
Endemic
කහ වරල් දෙපුල්ලියා /පෝතයා

Rasboroides nigromaginatus (Meinken 1957)
E - Black-lined Golden Rasbora
S - Kalu Waral Halmal Dandiya
Endemic, CR
කළු වරල් හල්මල් දංඩියා

CEJ
Centre For
Environmental
Justice

ලිපි ගනුදෙනු සඳහා

පරිසර යුක්ති කේන්ද්‍රය
20 ඒ, කුරුප්පු පාර, කොළඹ 08.

දුරකථනය : +94 112 683282 ෆැක්ස් : +94 112 683282
ඊ මේල් : info@ejusttice.lk වෙබ් : www.ejustice.lk